# සාමාන්‍ය සමයේ විසිවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

රූත්ගේ කථාවෙන් ගත් පාඨයෙකි.

රූත් 1: 1, 3-6, 14-16, 22

නයෝමි රූත් සමග බෙත්ලෙහෙමට පැමිණියා ය.

වීර පුරුෂයන් ඉශ්රායෙල් රට පාලනය කරන සමයේ දී ඒ රටේ සාගතයක් ඇති විය. එහෙයින්, ජුදා දේශයේ බෙත්ලෙහෙමේ එක්තරා මිනිසෙක් මෝවබ් දේශයෙහි ටික කලක් පදිංචි වීමට තම බිරිඳ ද පුතුන් දෙදෙනා ද කැටුව එහි ගියේය. එහිදී නයෝමිගේ ස්වාමි පුරුෂයා වූ එලිමෙලෙක් මළේය. නයෝමිට ඉතිරි වූයේ පුත්තු දෙදෙනා පමණි. ඔවුන් දෙදෙනා ඕර්පා සහ රූත් නම් මෝවබ් ජාතික තරුණියන් දෙදෙනෙකු සරණ පාවා ගෙන එහි දස වසක් පමණ ජීවත් වූහ. ඉන්පසු පුතුන් දෙදෙනා වන මාලොන් ද කිලියොන් ද මළහ. එවිට පුතුන් දෙදෙනා ද ස්වාමි පුරුෂයා ද නැති වූයෙන් නයෝමි තනි වූවාය. ඉශ්රායෙල් දේශයේ අස්වැන්න සරු කිරීමෙන් තම සෙනගට සමිඳාණන් වහන්සේ පිහිට වූ බව නයෝමිට ආරංචි විය. එහෙයින් ඈ මෝවබ් දේශය අත්හැර තම ලේලින් දෙදෙනා සමඟ එහි යෑමට සූදානම් වූවාය.

ඔව්හු නැවතත් හඬා වැලපෙන්නට පටන් ගත්හ. ඕර්පා තම නැන්දම්මා සිඹ සමුගෙන තමාගේ නෑදෑයින් වෙත ගියා ය. එහෙත් රූත් තම නැන්දම්මාට ඇළුම්කමින් බැඳී සිටියා ය. එවිට නයෝමි රූත්ට මෙලෙස කීවාය. “බලන්න, ඔබේ නෑනා තම නෑදෑ හිතවතුන් වෙත ද තම කුල දෙවියා වෙත ද ආපසු ගියාය. ඔබත් ඈ සමඟ යන්න.” එහෙත් රූත්

උත්තර දෙමින් මෙසේ කීවාය. "මට ඔබ අත්හැර යන්නටවත්, ඔබ සමඟ නොඑන්නටවත් පෙරැත්ත නොකරන්න. ඔබ යන ඕනෑම තැනකට මමත් යමි. ඔබ ජීවත් වන ඕනෑම තැනක මමත් ජීවත් වෙමි. ඔබේ සෙනඟ මාගේ සෙනඟ ය. ඔබේ දෙවියෝ මාගේ දෙවියෝ ය."

මෙසේ නයෝමි තම ලේලි වන මෝවබ් ජාතික රූත් සමඟ මෝවබ් දේශයෙන් ආපසු පැමිණියාය. ඔවුන් බෙත්ලෙහෙමට පැමිණියේ බාර්ලි අස්වැන්න රැස් කරන්නට පටන් ගත් කාලයේ දී ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 146 : 5 – 10

පිළිතුර: මාගේ සිත සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

ගීය:

ජාකොබ්ගේ දෙවිඳුන් සරණ පතන, සිය දෙවි සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු තබන තැනැත්තේ වාසනාවන්ත ය.
එතුමාණෝ අහසත් පොළොවත් මුහුදත් එහි ඇති සියල්ලත් මැවූ සේක. එතුමාණෝ සදාකල්ම විශ්වාසීව සිටින සේක.

සමිඳාණෝ පීඩා විඳින්නන්ට යුක්තිය ඉටු කර දෙන සේක. සාගිනි වූවන්ට ආහාර දෙන සේක.
එතුමාණෝ සිරකරුවන් මුදන සේක. අන්ධයන්ගේ ඇස් පහදන සේක. වැටී ගියවුන් නඟා සිටුවන සේක. සමිඳාණෝ දමිටුවන්ට ප්‍රේම කරන සේක.

විදේශීන් ආරක්ෂා කරන සේක. අනාථයන්ට හා වැන්දඹුවන්ට උපකාර කරන සේක.
එහෙත් දුදනාගේ යෝජනා සුන් කරන සේක.
සමිඳාණෝ සදහට ම රජකම් කරන සේක. එම්බා සියොන් නගරය! ඔබේ සමිඳාණෝ සියලු පරම්පරා දක්වා රජකම් කරන සේක. සමිඳ
ුන්ට ප්‍රශංසා වේවා!

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබවහන්සේගේ ව්‍යවස්ථාවෙහි
පුදුම අගයන් දක්නා පිණිස
අපගේ ඇස් පැහැදුව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබවහන්සේගේ මාවත් අපට ඉගැන්නුව මැනව.
සත්‍යය අනුව අප ගෙන ගිය මැනව.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 23: 34–40

තුඹේ දෙවි ස්වාමින් වහන්සේට ප්‍රේම කරන්න.
තුඹට මෙන් තුඹේ අසල්වැසියාට ද ප්‍රේම කරන්න.

ජේසුස් වහන්සේ සද්දුසිවරුන් නිරුත්තර කළ බව අසා පරිසිවරු එක්රුස් වූහ. ඔවුන් අතරෙන් විනයධරයෙක් උන්වහන්සේ පරීක්ෂා කරමින්, “ගුරු දේවයෙනි, ව්‍යවස්ථාවලියෙහි ශ්‍රේෂ්ඨතම ආඥාව කිමෙක්දැ” යි ඇසීය. උන් වහන්සේ ඔහුට කතා කොට, “තුඹේ මුළු හෘදයෙන් ද තුඹේ මුළු සිතින් ද තුඹේ මුළු බුද්ධියෙන් ද තුඹේ දෙවි ස්වාමින් වහන්සේට ප්‍රේම කරන්න. මෙය ශ්‍රේෂ්ඨතම පළමුවන ආඥාව ය. දෙවන ආඥාව ද එයට සමාන ය. එනම් තුඹ තුඹට ප්‍රේම කරන්නාක් මෙන් තුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න යනුයි. මුළු ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය රඳා ඇත්තේ මේ ආඥා දෙක මත ය”යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.